# පුංචි පූස් පැටියා



ආර්. එම්.කෙනුලි සනුල්‍යා කුමාරි රත්නායක

පුංචි පූස් පැටියා

ආර්. එම්.කෙනුලි සනුලායා කුමාරි රත්නායක

ISBN No:- 978-624-206-931-9

කතෘගේ වෙනත් කෘති:- පුංචි සෙනුරි

2023.12.24

## පිදුම

මාගේ ආදරණීය

අම්මාටත්, අප්පච්චිටත්,

පන්තිභාර ගුරු මෑණියන්ටත්

මේ පුංචි පොත

ආදරයෙන් පුදකරමි.

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන්ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩනැගීම අපේක්ෂාවයි එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත් කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මඟපෙන්වීම යටතේ ලේඛන කරණය සහජයෙන් උරුම කරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොටගෙන ග්‍රන්ථකරණයට යොමු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණය කරමින් " දිවිය දිනන විද්‍යුත් පොතක් " ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගය කරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක් " ව්‍යාපෘතිය එක්වූ පුංචි ලේඛක ලෙඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුන අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවායි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහය දැක්වූ අප පාසලේ කළමණාකරණ මණ්ඩලය ගුරු භවතුන් දෙමාව්පියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමු කළ විදුහල්පතිවරුන් ගුරු භවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තූතිය මෙමඟින් පිරිනමමි.

මෙම ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත් කරමින් එයට ජීවයක් වූ සෙනෙවිරත්න මහලේකම්ගේ සේවය ද අගයමි.

ශෂිකලා සේනාධීර
විදුහල්පතිනිය
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර


එකමත් එක කාලයක ලස්සනට හඳ පායලා තියෙන දවසක පූස් අම්මෙක් අපේ ගෙදරට ආවා. ඉතින් මේ පූස් අම්මට මේ ලස්සන රාත්‍රියේ පූස් පැටවු හය දෙනෙක් ලැබුණා. මේ පූස් පැටවු එක එක පාටයි. දෙන්නෙක් සුදු පාටයි, එක්කෙනෙක් දුඹුරු පාටයි තවත් දෙන්නෙක් කළු පාටයි. අන්තිම පැටියා අළු පාටයි.



ඔන්න මේ පූස් අම්මා පුංචි පැටවු හය දෙනාව එයාලගෙ ගෙදර එක්කන් යන්න ලෑස්ති වුණා. ඉතින් පූස් අම්මා පැටවු හය දෙනාම එකම සැරේ ගෙනියන්න බැරි නිසා එකඑක පැටිය ගානේ ගෙනියන්න තීරණය කළා. ඔන්න අන්තිමට ලැබුණු පූස් පැටියාව පූස් අම්මට ගෙනියන්න බැරි වුණා.




ඉතින් යාළුවනේ ඔයාලා දන්නවද ඒ ඇයි කියලා. ඔන්න ඉතින් අහන්නකෝ. මේ චූටි පූස් පැටියගේ අයියලා අක්කලා ටික අම්මා අරගෙන ගියාම මේ පූස් පැටියා තනි වුණා. පූස් අම්මා නැති නිසා මේ පූස් පැටියාට හොඳටම සීතල වෙලා, එතන තිබුණ රෙදි කෑල්ලක් අස්සට රිංගුවා. ඒ නිසා පූස් අම්මට පැටියව හොයාගන්න බැරි වුණා.



ඔන්න ඉතින් උදේ වුණා. කුරුල්ලෝ කිචි බිචි කියනවා. හිරු ලස්සනට පායලා. උදෙන්ම මම එළියට ආවා. මට අමුතු සද්දයක් ඇහුණා. මම වටපිට බැලුවා කොහෙන්ද ඒ සද්දේ එන්නේ කියලා. එතන තිබුණ රෙදි කෑල්ලක් අස්සෙන් තමයි සද්දේ ඇහුනේ. මම ඒ රෙදි කෑල්ල කොණකින් උස්සලා බැලුවා. බලද්දි පුංචි පූස් පැටියෙක්.



අනේ... ලස්සන අළුපාට බෝලයක් වගේ පූස් පැටියෙක්. පව් පූස් පැටිය කෑ ගහනවා. එයාට හොඳටම බඩගිනි ඇති. ඉතින් මම අම්මට කියලා කිරි එකක් හදාගෙන පොවන්න ලෑස්ති වුණා. ඒත් එයා කිරි බොන්න දන්නේ නෑ. ඒ නිසා මම පහන් තිරයක් අරගෙන ඒක කිරි වලින් පොඟවලා පෙව්වා. එයා ඒක උර උර බිව්වා. ඉතින් මම හිතුවා එයාව අපේ ගෙදර තියාගන්න. මම දුවලා ගියා අප්පච්චි ළඟට ගියා. ගිහින් අප්පච්චිගෙන් ඇහුවා පූස් පැටියා තියාගන්නද කියලා. අප්පච්චිත් කැමති වුණා. මට හරිම සතුටුයි.



ඔන්න යාළුවනේ මම මගේ පුංචි පූස් පැටියට නමකුත් දැම්මා. ඔයාලා දන්නවද ඒ මොකක්ද කියලා. ඒ නම තමයි අළු බෝලේ. ඔයාලා දන්නවද මම ඒ නම දැම්මේ ඇයි කියලා. මොකද ඒ පූස් පැටියා අළු පාට බෝලයක් වගේමයි. හරිම ලස්සනයි.



ඉතින් මම අප්පච්චිත් එක්ක එකතුවෙලා පූස් පැටියට ඉන්න තැනක් හැදුවා. අනේ මගේ පූස් පැටියා හරිම හුරතල්. මමයි මගේ අයියායි අක්කායි පූස් පැටියත් සමඟ සෙල්ලම් කරනවා. අපේ පුංචි පූස් පැටියා අපිත් එක්ක සතුටින් ජීවත් වෙනවා.





## පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතු වීමත් සමඟ සිදුවන සමාජ ආර්ථික පරිවර්ථනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීපකරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍ය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යාංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී ඒ යටතේ වැඩාම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්ථාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන්ය පාසල තුළ ගොඩනැගී ලේඛණ සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය ඒ තුළින් සම්පාදන වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතරම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මඟපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි පාසල් මට්ටමින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද සංකල්ප මංකොල්ලයන්ට හසුවෙමින් පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත්කරමි

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමඟ එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු

මෙයට
සෙනෙවිරත්න මහලේකම්
පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාතෘ
2023.10.20